# ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය



ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය

ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**ISBN : 978-955-577-941-8**

**ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශය**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**සංඛ්‍යාන මන්දිරය,**
**නො. 306/71, පොල්දූව පාර,**
**බත්තරමුල්ල**
**2015.05.20**

# පෙරවදන

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත දිනපතා විවිධ දත්ත ඉල්ලීම්, දත්ත භාවිත කරන්නන්ගෙන් යොමුවේ. සෑම දත්ත ඉල්ලීමක්ම සපුරාලීම අපහසු කාර්යයක් වන නමුදු දෙපාර්තමේන්තුව විසින් වගකීම දරන නිල සංඛ්‍යාලේඛන ඇතුළත් ප්‍රකාශන මඟින් හා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් දත්ත භාවිත කරන්නන්ගේ ඉල්ලීම් උපරිමයෙන් ඉටු කිරීමට දෙපාර්තමේන්තුව සෑම විටම උත්සාහ දරයි.

ජන හා නිවාස සංගණනයේ දී එක් රැස් කරන ලද ප්‍රජාවිද්‍යා තොරතුරු ඇසුරින් සකස්කල ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය පිළිබඳව විස්තරාත්මක තොරතුරු රැසක් මෙම ප්‍රකාශනයෙහි ඇතුළත්වේ. ජන සංගණන හා ප්‍රජාවිද්‍යා අංශයේ අධ්‍යක්ෂ අයි. ආර්. බණ්ඩාර මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම අනුව සංඛ්‍යාලේඛනඥ එස්.ටී.සී.ගවේෂිකා මහත්මිය විසින් මෙම පොත සකස්කරන ලදී. මෙහි දක්වා ඇත්තේ මෙම ක්ෂේත්‍රය පිළිබඳව රචකයාගේ අදහස් වන අතර මෙම තොරතුරු අදාල ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යනය කිරීම සඳහා දත්ත භාවිත කරන්නන්හට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.



ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
2015.05.20

# පෙළගැස්ම


පෙරවදන iii
වගු ලැයිස්තුව v
රූපසටහන් ලැයිස්තුව v
සාරාංශය ix
වැඩිහිටි ජනගහනය පිළිබඳ වැදගත් තොරතුරු x

හැඳින්වීම..................................................... 1

වැඩිහිටි ජනගහනයේ වර්ධනය............................... 2

වැඩිහිටි ජනගහනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ................. 6

වැන්දඹුභාවය ................................................. 9

වැඩිහිටියන්ගේ සුරක්ෂිතතාව................................ 10

වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ........................... 12

වැඩිහිටියන්ගේ සමාජ සුභසාධන අවශ්‍යතා...................... 14

වැඩිහිටි ජනගහනය පිළිබඳ සංඛ්‍යාලේඛන............................... 17

## වගු ලැයිස්තුව


| වගුව | නම | පිටු අංකය |
|---|---|---|
| 1 | වැඩිහිටි ජනගහනයේ වර්ධනය 1946-2012 | 4 |
| 2 | සංගණන වර්ෂ කිහිපයක දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය සහ මුළු සාඵල්‍යතා අනුපාතිකය | 5 |
| 3 | වැඩිහිටියන්ගේ සාක්ෂරතාව ස්ත්‍රී පුරුෂ බව අනුව | 8 |
| 4 | වැඩිහිටියන්ගේ සාක්ෂරතාව පදිංචි අංශය හා ස්ත්‍රී පුරුෂ බව අනුව | 8 |
| 5 | වැඩිහිටි ජනගහනය වයස් කාණ්ඩ අනුව වැන්දඹුභාවය | 9 |
| 6 | ගෘහකාණ්ඩවල සිටින මුළු වැඩිහිටි ජනගහනය ගෘහමූලිකට ඇති නෑදෑකම අනුව | 10 |
| 7 | වැඩිහිටි ජනගහනය වයස් කාණ්ඩ අනුව ආර්ථික කටයුතුවල නියැලීම | 12 |


## රූප සටහන් ලැයිස්තුව


| රූප සටහන | නම | පිටු අංකය |
|---|---|---|
| 1 | දිස්ත්‍රික්ක අනුව වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය - 2012 | 3 |
| 2 | වැඩිහිටි ජනගහනයේ වර්ධනය 1946-2012 | 4 |
| 3 | පුළුල් වයස් කාණ්ඩවල ජනගහනයේ වෙනස්වීම 1981, 2012 | 5 |
| 4 | වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩිහිටි ජනගහනය - 2012 | 7 |
| 5 | පුමිතිරි අනුපාතය වයස් කාණ්ඩ අනුව 1981, 2012 | 7 |
| 6 | ස්ත්‍රී පුරුෂ බව හා වයස් කාණ්ඩ අනුව ගේ දොර වැඩ කටයුතුවල නිරත වැඩිහිටියන් ගේ ප්‍රතිශත - 2012 | 11 |
| 7 | වැඩිහිටි ජනගහනය ආර්ථික කටයුතුවල නියැලීම - 2012 | 11 |
| 8 | වයස් කාණ්ඩ අනුව ශාරීරික අපහසුතා ඇති වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශත - 2012 | 13 |
| 9 | ශාරීරික අපහසුතාව අනුව වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශත - 2012 | 13 |

## සාරාංශය

පසුගිය දශක කිහිපයක් තුළ ජන හා නිවාස සංගණන මගින් රැස් කරන ලද තොරතුරු වයස් කාණ්ඩ අනුව විශ්ලේෂණය කිරීමේ දි වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවන බව පෙනේ. කෙටි කාලයක් තුළ ජනගහනයෙන් සැළකිය යුතු පිරිසක් වයස අවුරුදු 60ට වඩා වැඩි වයස් කාණ්ඩවලට අයත් වීම දියුණුවෙමින් පවත්නා රටකට විශාල අභියෝගයක් වන බැවින් එයට මුහුණදීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ විසින් සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ.

2012 ජන හා නිවාස සංගණනයේ දී වාර්තාවූ පරිදි ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් සංඛ්‍යාව 2,520,573ක් එනම් මුළු ජනගහනයෙන් සියයට 12.4ක් වූ අතර ඉන් 1,404,922ක් (55.7%) වැඩිහිටි කාන්තාවන් වේ. වැඩිහිටි පුරුෂයන් සංඛ්‍යාව 1,115,651 (44.3%) කි. ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින් ජීවත්වන ස්ථානය අනුව ද ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැක. එනම් ගෘහ කාණ්ඩවල ජීවත්වන පුද්ගලයින් සහ වෙනත් වැඩිහිටි නිවාස වැනි ආයතනවල ජීවත්වන පුද්ගලයින් ලෙසය. ජන හා නිවාස සංගණනයෙන් වාර්තා වූ තොරතුරු අනුව වැඩිහිටියන්ගෙන් සියයට 99ක්ම ගෘහ කාණ්ඩවල ජීවත් වේ. සංගණන තොරතුරු අනුව වැඩිහිටි ජනගහනයෙන් සියයට 78ක් අයත් වන්නේ අවුරුදු 60-74ක් අතරේ වන තරුණ වැඩිහිටි කාණ්ඩයට වන අතර ඉතිරි සියයට 22 අවුරුදු 74ට වඩා වැඩි වයස්ගත පුද්ගලයෝ වෙති. තවද වැඩිහිටි පුද්ගලයින්ගෙන් සියයට 25ක් පමණ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වන බව ද දත්ත අනුව පෙනේ. වැඩිහිටියන්ගේ විවාහක තත්ත්වය පිළිබඳව අධ්‍යනය කිරීමේ දී සෑම වැඩිහිටියන් 5දෙනෙකුගෙන්ම එක් අයෙක් වැන්දඹු බව සංගණන දත්ත අනුව පැහැදිලි වේ. තවද ස්ත්‍රී පුරුෂ බව අනුව වැන්දඹු භාවය අධ්‍යයනය කිරීමේ දී වයස අවුරුදු 60ට වැඩි ස්ත්‍රීන්ගෙන් සියයට 86.3ක් වැන්දඹු වේ.

ශ්‍රී ලාංකීය වැඩිහිටි ජනගහනය සංඛ්‍යාත්මකව ඉහළ යාමෙන් රටෙහි ශ්‍රම බලකායට අනාගතයේ දී වන පීඩනය අවම කිරීම සඳහා මේ වන විට සුදුසු වැඩසටහන් ක්‍රියත්මක වීම ආරම්භ විය යුතුය. මෙහිදි වැඩිහිටි සුරක්ෂිතභාවය පිළිබඳව ආකල්පමය වර්ධනයක් සිදුවිය යුතු අතර වැඩිහිටියන් රැකබලා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

## වැඩිහිටි ජනගහනය පිළිබඳ වැදගත් තොරතුරු

| | |
|---|---|
| **මුළු වැඩිහිටි ජනගහනය** | **2,520,573** |
| පුරුෂ වැඩිහිටි ජනගහනය | 1,115,651 |
| ස්ත්‍රී වැඩිහිටි ජනගහනය | 1,404,922 |
| 60-64 අතර වැඩිහිටි ජනගහනය | 917,910 |
| 65-69 අතර වැඩිහිටි ජනගහනය | 633,289 |
| 70-74 අතර වැඩිහිටි ජනගහනය | 412,414 |
| 75-79 අතර වැඩිහිටි ජනගහනය | 283,186 |
| 80 සහ ඊට වැඩි වැඩිහිටි ජනගහනය | 273,774 |
| නාගරික අංශයේ වැඩිහිටි ජනගහනය | 473,991 |
| ග්‍රාමීය අංශයේ වැඩිහිටි ජනගහනය | 1,943,372 |
| වතු අංශයේ වැඩිහිටි ජනගහනය | 103,210 |
| ආර්ථික වශයෙන් ක්‍රියාශීලී වැඩිහිටි ජනගහනය | 636,779 |
| වැන්දඹු වැඩිහිටි ජනගහනය | 526,672 |
| වැන්දඹු පුරුෂ වැඩිහිටි ජනගහනය | 72,088 |
| වැන්දඹු ස්ත්‍රී වැඩිහිටි ජනගහනය | 454,584 |
| දූ දරුවන්ගේ රැකවරණය ලබන වැඩිහිටි ජනගහනය | 437,000 |

# ශ්‍රී ලංකාවේ ඉහළ යන වැඩිහිටි ජනගහනය

## හැඳින්වීම

ජනගහනය වයස්ගතවීම සමස්ත ලෝක ප්‍රජාවම හමුවේ වන ගැටළුවකි. මේ වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය වයස්ගතවීමේ රටාව ජපානය හා වෙනත් යුරෝපා රටවල් වර්තමානයේ අත්විඳින වේගවත් රටාවට ආසන්න වෙමින් පවතී. සංවර්ධිත රටවල්වල සමාජ හා ආර්ථික දියුණුව නිසා එම රටවල්වල වැඩිහිටියන්ගේ සුරක්ෂිතතාව කෙරෙහි විධිමත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇත. එහෙත් දියුණුවෙමින් පවත්නා ශ්‍රී ලංකාව වැනි රටක මෙලෙස කෙටි කලක් තුළ ජනගහනයෙන් සැළකිය යුතු පිරිසක් වයස අවුරුදු 60ට වඩා වැඩි වයස් කාණ්ඩවලට අයත් වීම විශාල අභියෝගයක් වේ. මෙම අභියෝගයට මුහුණදීම සඳහා රජය විසින් දැනටමත් වයස්ගත ජනගහනය ඉලක්කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට සුදුසු සැලසුම් සකස් කිරීම ද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම ද විවිධ ප්‍රතිපත්ති සකස් කිරීම ද විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කොට ඇත.

ශ්‍රී ලංකාවේ ජන සංගණන ඉතිහාසයේ පළමු ජන සංගණනය 1871 වර්ෂයේ දී පවත්වා ඇත. එම සංගණනයේ දී වාර්තා වූ පරිදි මුළු ජනගහනය මිලියන 2.4 ක් විය. පළමු ජන සංගණනයෙන් වසර 141ට පසු 2012 වසරේ දී පැවති ජන හා නිවාස සංගණනයේ දී වැඩිහිටි ජනගහනය පමණක් මිලියන 2.5ක් වාර්තා වී තිබේ. වත්මන් ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට සියයට 12.4කි. රූප සටහන 1 අනුව වැඩිහිටි ජනගහනය ඒ ඒ දිස්ත්‍රික්කයේ සිටින මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට වැඩිම වැඩිහිටි ජනගහනය කෑගල්ල දිස්ත්‍රික්කයෙන් (14.9%) ද අඩුම වැඩිහිටි ජනගහනය මඩකලපුව දිස්ත්‍රික්කයෙන් (7.6%) ද වාර්තා වේ. නැගෙනහිර දිශාවෙහි පිහිටි දිස්ත්‍රික්කවල සිට බටහිර දිශාවෙහි පිහිටි දිස්ත්‍රික්ක දක්වා යමේදී (යාපනය දිස්ත්‍රික්කය හැර) වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව රූප සටහන 1 අනුව නිරීක්ෂණය කළ හැකිය.

බොහෝ රටවල් වැඩිහිටි ජනගහනය කොටස් දෙකකට වෙන්කර ඇත. ඒ අනුව වයස අවුරුදු 60-74 දක්වා "තරුණ වැඩිහිටි" ලෙසද වයස අවුරුදු 75 සහ ඊට වැඩි වැඩිහිටි ජනගහනය "මහලු වැඩිහිටි" ලෙස ද හැඳින්වේ. දත්ත අනුව වැඩිහිටි ජනගහනයෙන් සියයට 78ක් අයත් වන්නේ ආර්ථිකයට කිසියම් ඵලදායි දායකත්වයක් ලබාදීමේ හැකියාව පවතින තරුණ වැඩිහිටි (අවුරුදු 60-74) කාණ්ඩයට වේ. ඉතිරි සියයට 22 අවුරුදු 74ට වඩා වැඩි වයස්ගත පුද්ගලයෝ වෙති.

ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින සංස්කෘතික ලාක්ෂණික අනුව වයස්ගත වැඩිහිටියන් රැකබලා ගැනීම පවුලේ දූ දරුවන් හා වෙනත් නෑදැයින් විසින් සිදු කරයි. සංගණන තොරතුරු අනුව ගණනය කළ පරිදි ශ්‍රී ලංකාවේ සමස්ත යැපුම් අනුපාතය 60.2 වූ අතර මහලු යැපුම් අනුපාතය 19.8 කි. මින් අදහස් වන්නේ ශ්‍රම


බලකායට අයත් පුද්ගලයින් සිය දෙනෙකු විසින් යැපෙන්නන් 60 දෙනෙක් රැකබලා ගන්නා බවයි. එම යැපෙන්නන් 60 දෙනා අතර ද වැඩිහිටි යැපෙන්නන් 20 දෙනෙක් සිටියි. 1981 ජන සංගණන දත්ත අනුව එක් වයස්ගත පුද්ගලයෙකු ගේ රැකවරණය සැලසීම සඳහා ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් 9 දෙනෙක් සිටි බව පැහැදිලි වේ. එහෙත් 2012 දී එක් වයස්ගත පුද්ගලයෙකුගේ රැකවරණය සැලසීම සඳහා වන ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් සංඛ්‍යාව 5 දක්වා අඩු වී ඇත. එනම් ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ශ්‍රම බලකායට පෝෂණය කළ යුතු වැඩිහිටි යැපෙන්නන් සංඛ්‍යාව ගත වූ වසර 31 තුළ වැඩි වී තිබේ.

ඉදිරියේ දී මෙලෙස ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය වර්ධනය වීම නිසා ආර්ථික හා සමාජීය වෙනස්කම් බොහොමයක් සිදුවනු ඇත. වැඩිහිටියන්ට රැකවරණය ලබාදීම සඳහා නිවාස, සෞඛ්‍ය, ප්‍රවාහන ආදී පහසුකම් තව දුරටත් පුළුල් කළ යුතු වේ. වයස අවුරුදු 60ට වඩා වැඩි වයස් කාණ්ඩවලට අයත් ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඵලදායි ශ්‍රම දායකත්වයක් ආර්ථිකයට ලබාදේ. ඔවුන්ගේ පරිණතබව හා දැනුම රටේ ආර්ථිකයේ දියුණුවට ඵලදායි ලෙස ලබා ගැනීමට සැලසුම් සකස් විය යුතු අතර වැඩිහිටියන්ට අවශ්‍යවන පහසුකම් වැඩි දියුණු කිරීමෙන් තෘප්තිමත් වැඩිහිටි සමාජයක් මෙරට ඇති කිරීමට කටයුතු කළ යුතුයි. ඒ අනුව ඉදිරියේ දී වැඩිහිටි ජනගහනයේ වර්ධනය ආර්ථිකයට ඵලදායි අන්දමට යෙදවීමට සහ වැඩිවන ජනගහනයේ සමාජ සුභසිද්ධිය නංවාලීම සඳහා රජයට ප්‍රතිපත්ති සම්පාදනයට නිවැරදි හා කාලීන දත්ත ලබා ගැනීමට 2012 ජන හා නිවාස සංගණන තොරතුරු ඉතාමත් ප්‍රයෝජනවත් වේ. සංගණන තොරතුරු මගින් වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩිහිටි ජනගහනය බෙදී ඇති ආකාරය පිලිබඳ නිවැරදි තොරතුරු ලබාගත හැක. මීට අමතරව වැඩිහිටි ජනගහනය දැනට යෙදී සිටින විවිධ ආර්ථික කටයුතු පිළිබඳව ද, මේ වන විට මුහුණ පා ඇති විවිධ ශාරීරික අපහසුතාවන් පිළිබඳව ද තොරතුරු සංගණනයෙන් ලබා ගත හැක.

## වැඩිහිටි ජනගහනයේ වර්ධනය


වැඩිහිටි ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වීම අධ්‍යයනය කිරීම සඳහා 1946-2012 අතර කාල වකවානුව තුළ වයස අවුරුදු 60ට වැඩි ජනගහන ප්‍රතිශතයන් හා අවුරුදු 65ට වැඩි ජනගහන ප්‍රතිශතයන් වගුව 1 හි දක්වා ඇත. මෙම දත්ත අනුව වයස් ගත ජනගහනය සීඝ්‍රයෙන් ඉහළ යාම ආරම්භ වූයේ 80 දශකයෙන් පසුව බව පැහැදිලි වේ. තවද 1963 දී පැවති ජන සංගණනයේ දී වයස අවුරුදු 60ට වැඩි ජනගහනය මුළු ජනගහනයෙන් සියයට 6.0ක් වූ අතර 2012 සංගණනයේ දී එය මුළු ජනගහනයෙන් සියයට 12.4 දක්වා වැඩි වී ඇත. 1946 සිට 1981 දක්වා වසර 35ක කාල පරිච්ඡේදය තුළ වයස අවුරුදු 60ට වඩා වැඩි වයස්ගත ජනගහනය සියයට 5ත් 7ත් අතර අගයක් වූ අතර වයස අවුරුදු 65ට වැඩි වයස්ගත ජනගහනය සැලකීමේ දී එම අගය සියයට 3ත් 5ත් අතර විය.

රූපසටහන් 1 : දිස්ත්‍රික්ක අනුව වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය 2012



**වගුව1: වැඩිහිටි ජනගහනයේ වර්ධනය 1946-2012**

| සංගණන වර්ෂය | මුළු ජනගහනය | වයස අවුරුදු 60ට වැඩි ප්‍රතිශතය | වයස අවුරුදු 65ට වැඩි ප්‍රතිශතය |
|---|---|---|---|
| **1946** | 6,657,339 | 5.4 | 3.5 |
| **1953** | 8,097,895 | 5.4 | 3.5 |
| **1963** | 10,582,064 | 6.0 | 3.6 |
| **1971** | 12,689,897 | 6.3 | 4.2 |
| **1981** | 14,846,750 | 6.6 | 4.3 |
| **2012** | 20,359,439 | 12.4 | 7.9 |





දශක කිහිපයක් තුළ වැඩිහිටි ජනගහනය වර්ධනය වීමට බලපාන ලද පැහැදිලි හේතු ගණනාවක් තිබේ. සාපලාය්‍යතාව හා වයස් ව්‍යුහය වියපත් වීම තීරණය කරනු ලබන ප්‍රධානම සාධක වන අතර මර්ත්‍යතාව හා සංක්‍රමණ ද මෙහිදී සැලකිය යුතු බලපෑමක් සිදුකරයි. මෑත කාලයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදුවූ ශීඝ්‍ර දියුණුව නිසා සෞඛ්‍ය පහසුකම් වර්ධනය වීමත් සමඟ දළ උපත් හා දළ මරණ අනුපාතික ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. එසේම උපතේ දී අපේක්ෂිත ආයු කාලය ද පෙරට වඩා වැඩි වී තිබේ. මෑත කාලයේ දී

තරුණ ජනගහනයේ ජාත්‍යන්තර සංක්‍රමණ ඉහළ ගොස් ඇත. වැඩිහිටි ජනගහනය වර්ධනයවීමත් ශ්‍රම බලකාය මත ඇතිවන පීඩනය වැඩිවීමටත් මෙම සියලු කරුණු හේතු වී තිබේ. 1946 සිට 2012 දක්වා දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය හා මුළු සාපල්‍යතා අනුපාතිකය සංඛ්‍යාත්මකව වෙනස් වූ අන්දම පහත වගුව 2 හි දක්වා ඇත.

**වගුව 2: සංගණන වර්ෂ කිහිපයක දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය සහ මුළු සාපල්‍යතා අනුපාතිකය**

| වර්ෂය | දළ උපත් අනුපාතිකය | දළ මරණ අනුපාතිකය | මුළු සාපල්‍යතා අනුපාතිකය |
|---|---|---|---|
| **1946** | 37.4 | 19.8 | 5.5 |
| **1963** | 34.1 | 8.5 | 5.0 |
| **1981** | 28.2 | 5.9 | 3.8 |
| **2012** | 17.5 | 6.0 | 2.4 |

**රූපසටහන 3 : පුළුල් වයස් කාණ්ඩවල ජනගහනයේ වෙනස්වීම 1981, 2012**




පුළුල් වයස් කාණ්ඩ අනුව ජනගහනයේ වෙනස්කම් සිදුවූ ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා රූපසටහන 3 හි 1981 සහ 2012 වසරවල අවුරුදු 15ට වඩා අඩු, අවුරුදු 15-59 අතර සහ අවුරුදු 60 සහ ඊට වඩා වැඩි ජනගහනය දක්වා ඇත. 1981 - 2012 අතර කාලයේ දී සියයට 35.2 සිට 25.2 දක්වා ළමා ජනගහනය අඩු වූ අතර වැඩිහිටි ජනගහනය සියයට 6.6 සිට 12.4 දක්වා වැඩි වී ඇත. ළමා සහ වැඩිහිටි යැපෙන්නන් සියල්ලම රැකබලා ගැනීමට ඉදිරිපත්වන ශ්‍රම බලකායට අයත් අවුරුදු 15-59 වයස් කාණ්ඩයේ ජනගහනයේ වැඩිවීම සියයට 4.2කි. මේ අනුව ළමා සහ වැඩිහිටි ජනගහනවල මෑත කාලයේ දී සිදුවූ වෙනස්කම් අනුව ශ්‍රම බලකාය මත වන පීඩනය පැහැදිලි වේ.


## වැඩිහිටි ජනගහනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

වැඩිහිටි ජනගහනයේ ප්‍රජාවිද්‍යා පසුබිම පිළිබඳ අධ්‍යනය කිරීමේ දී ස්ත්‍රී වැඩිහිටි ජනගහනය පුරුෂ වැඩිහිටි ජනගහනය අභිබවායාම කැපී පෙනේ. 2012 ජන හා නිවාස සංගණන දත්ත අනුව මුළු වැඩිහිටි කාන්තාවන් සංඛ්‍යාව 1,404,922 කි. එනම් මුළු වැඩිහිටි ජනගහනයෙන් සියයට 56ක් කාන්තාවන් වේ. තවද වයස්ගත කාන්තාවන්ගේ සංඛ්‍යාව පුරුෂයන්ට වඩා 289,271කින් වැඩි බව සංගණන දත්ත තහවුරු කරයි. මීට අමතරව වයස අවුරුදු 80ට වඩා වැඩි පුද්ගලයින් සංඛ්‍යාව 273,774 වූ අතර එයින් ද සියයට 60ක් කාන්තාවන් වේ. ජනගහන ප්‍රක්ෂේපණ පෙන්වා දෙන පරිදි වසර 2031 වනවිට රැකබලා ගත යුතුවන වයස්ගත ජනගහනය මිලියන 5 දක්වා ඉහළ යා හැකි අතර අනිවාර්යයෙන් මෙම ජනගහනයෙන් බහුතරය කාන්තාවන් වනු ඇත[1]. තවද වැඩිහිටියන්ගේ ස්ත්‍රී පුරුෂ පුමිතිරි අනුපාතය සැලකීමේ දී කාන්තාවන් සියයකට සිටින පුරුෂයින් ගණන 79ක් බවත් වියපත්වීමේ දී වයස් කාණ්ඩය අනුව පුමිතිරි අනුපාතය අඩුවන බව ද දත්ත අනුව පෙනී යයි. එනම් වියපත්වීමේ දී පුරුෂයන්ට වඩා වැඩි කාන්තාවන් සංඛ්‍යාවක් සෑම වයස් කාණ්ඩයකම දැකිය හැක. මීට බලපාන ලද ප්‍රධාන හේතුව කාන්තාවන්ගේ උපතේ දී ආයු අපේක්ෂාව පුරුෂයන්ට වඩා වැඩි වීම නිසා කාන්තාවන් වැඩි කළක් ජීවත් වීම විය හැක.

[1] ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනය-ගැටළු සහ අනාගත අපේක්ෂාවන්




රූපසටහන 4 : වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩිහිටි ජනගහනය 2012




රූපසටහන 5 : පුම්තිරි අනුපාතය වයස් කාණ්ඩ අනුව 1981, 2012

සමස්තයක් ලෙස මෙරට කාන්තාවන්ගේ සාක්ෂරතාව පුරුෂයින්ගේ සාක්ෂරතාවට වඩා පහළ මට්ටමක පවතී. වර්තමානයේ වයස අවුරුදු 60ට වැඩි ජනගහනයෙන් බහුතරයකට නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද භුක්ති විඳීමේ අවස්ථාව නොලැබුන බැවින් අනෙකුත් වයස් කාණ්ඩවල පුද්ගලයින්ට වඩා වැඩිහිටි ජනගහනයේ සාක්ෂරතාව පහළ මට්ටමක පවතී. මෙම පහළ සාක්ෂරතා තත්ත්වය වැඩිහිටි කාන්තාවන් අතර බහුලව දැකිය හැක. වැඩිහිටි ජනගහනයේ සාක්ෂරතාව ස්ත්‍රී පුරුෂ බව හා පදිංචි අංශය අනුව නිරීක්ෂණය කළ විට වතු අංශයේ වැඩිහිටි කාන්තාවන්ගේ සාක්ෂරතාව අනෙකුත් අංශවල වැඩිහිටියන්ට

වඩා ඉතා පහළ බව පෙනේ. (වගුව 4 ) කාන්තාවන්ට අධ්‍යාපන වරප්‍රසාද හිමි වුවද බොහොමයක් ආර්ථික කටයුතු පුරුෂ ශ්‍රමය ඉලක්ක කර ඇති බැවින් හා පවතින සමාජ ක්‍රමය තුළ කාන්තාවට පවුල හා බැඳුනු වගකීම් රැසක් පවතින බැවින් සෑම අංශයකම කාන්තාවන්ට රැකියාවල නිරතවීමේ බාධක පවතිනවා විය හැක.

**වගුව 3: වැඩිහිටියන්ගේ සාක්ෂරතාව ස්ත්‍රී පුරුෂ බව අනුව - 2012**

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| **60 - 64** | 95.0 | 89.3 |
| **65 - 69** | 94.2 | 86.0 |
| **70 - 74** | 93.2 | 82.3 |
| **75 - 79** | 90.9 | 76.8 |
| **80 ට වැඩි** | 89.4 | 74.5 |

**වගුව 4: වැඩිහිටියන්ගේ සාක්ෂරතාව පදිංචි අංශය හා ස්ත්‍රී පුරුෂ බව අනුව - 2012**

| වයස් කාණ්ඩය | නාගරික | | ග්‍රාමීය | | වතු | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| **60 - 64** | 97.6 | 94.6 | 94.9 | 89.9 | 86.4 | 59.0 |
| **65 - 69** | 97.5 | 93.4 | 93.9 | 86.2 | 85.8 | 52.1 |
| **70 - 74** | 97.1 | 91.3 | 92.8 | 81.9 | 83.0 | 45.7 |
| **75 - 79** | 96.3 | 89.8 | 90.2 | 75.2 | 79.6 | 37.7 |
| **80 ට වැඩි** | 95.3 | 88.3 | 88.4 | 72.0 | 78.0 | 38.3 |

මෙරට කාන්තාවන් අතරින් කිසියම් ආර්ථික කටයුත්තක් සඳහා සක්‍රීය වශයෙන් දායකවන්නේ සියයට 35කට ආසන්න පිරිසකි[2]. මෙම පිරිසෙන් ද බහුතරයක් තම දෑත මෙහෙයවා සිදුකරනු ලබන (දළු නෙලීම, රබර් කිරි කැපීම, හේන් වැඩ ආදී කෘෂිකාර්මික කටයුතු; ඇඳුම් මැසීම, කරවල වේලීම ආදී ස්වයං රැකියා) රැකියාවන්වල නිරතවේ. වයස්ගත වීමේ දී දුබල ශාරීරික හා මානසික තත්ත්වයන් මත කාන්තාවන් වැඩිපිරිසකට තමන් තරුණ කාලයේ දී යෙදී සිටි හා හුරුපුරුදු ආර්ථික කටයුතුවලින් ඈත්වීමට සිදුවේ. ඒ අනුව බලනවිට වයස්ගතවීමත් සමඟ කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය යහපත් නොවන බවත් කිසියම් වෙනත් පාර්ශ්වයක යැපෙන්නන් ලෙස ජීවත්වීමට සිදුවන බවත් පැහැදිලිය. සංගණන දත්ත අනුව ශාරීරික අපහසුතාවන් ද කාන්තාවන් අතර බහුල වේ. තවද බහුතරයක් වැඩිහිටි කාන්තාවන් වැන්දඹුවීමත්, එම කාන්තාවන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවීමත් නිසා වැඩිහිටි කාන්තාවන් සංඛ්‍යාව ඉහළ යෑම අනාගතයේ සමාජීය ප්‍රශ්න ගණනාවක ආරම්භය විය හැක.

## වැන්දඹුභාවය

වැඩිහිටි ජනගහනයේ විවාහක තත්ත්වය පිළිබඳ සංඛ්‍යාලේඛන පිරික්සීමේ දී වැන්දඹුභාවය ද කැපී පෙනන ලාක්ෂණිකයක් වී ඇත. වයස අවුරුදු 60ට වැඩි සෑම වැඩිහිටියන් 5දෙනෙකුගෙන්ම එක් අයෙක් වැන්දඹු වේ. ස්ත්‍රී පුරුෂ බව අනුව වැන්දඹුභාවය අධ්‍යයනය කිරීමේ දී අවුරුදු 60ට වැඩි ස්ත්‍රීන්ගෙන් සියයට 86.3ක් වැන්දඹු බව වගුව 5 මඟින් හෙළිවේ. එමෙන්ම ස්ත්‍රී වැන්දඹු ප්‍රතිශතය සෑම වයස් කාණ්ඩයකම ඉහළ අගයක් ගනී.

**වගුව 5: වැඩිහිටි ජනගහනය වයස් කාණ්ඩ අනුව වැන්දඹුභාවය**

| වයස් කාණ්ඩය | මුළු වැඩිහිටියන් ගණන | වැන්දඹු වැඩිහිටියන් ගණන | % | වැන්දඹු වැඩිහිටියන් ගණන | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | % | ස්ත්‍රී | % |
| **එකතුව** | **2,520,573** | **526,672** | **20.9** | **72,088** | **13.7** | **454,584** | **86.3** |
| **60-64** | 917,910 | 117,393 | 12.8 | 12,794 | 10.9 | 104,599 | 89.1 |
| **65-69** | 633,289 | 116,367 | 18.4 | 13,506 | 11.6 | 102,861 | 88.4 |
| **70-74** | 412,414 | 101,471 | 24.6 | 13,178 | 13.0 | 88,293 | 87.0 |
| **75-79** | 283,186 | 89,363 | 31.6 | 12,802 | 14.3 | 76,561 | 85.7 |
| **80ට වැඩි** | 273,774 | 102,078 | 37.3 | 19,808 | 19.4 | 82,270 | 80.6 |

[2] ශ්‍රම බල සමීක්ෂණය 2012

## වැඩිහිටියන්ගේ සුරක්ෂිතතාව

වැඩිහිටි ජනගහනය වැඩිවීමත් සමඟ ඔවුන්ගේ රැකවරණය සඳහා සුදුසු ක්‍රියාමාර්ග සකස් කළ යුතුවේ. සංගණන තොරතුරු අනුව ගෘහ කාණ්ඩවල සිටින මුළු වැඩිහිටි ජනගහනය 2,496,038 (99%)ක් ලෙස ද විවිධ ආයතනවල නවාතැන්ගෙන සිටින වැඩිහිටි ජනගහනය 24,535(1%) ලෙස ද වාර්තා වී ඇත. සංගණන තොරතුරු අනුව තම දූ දරුවන් ගේ රැකවරණය ලබමින් සිටින වැඩිහිටියන් සංඛ්‍යාව 437,000 (17%)කි. වැඩිහිටියන්ගෙන් 13,081ක් ගෘහ ආශ්‍රිත සේවකයින් ලෙස ගෘහ කාණ්ඩවල සිටින බව ද හෙළි වේ. ගෘහකාණ්ඩවල ජීවත්වන වැඩිහිටියන් ගෘහමූලිකට ඇති නෑදෑකම අනුව තොරතුරු පහත වගුවේ දක්වා ඇත.


**වගුව 6 : ගෘහකාණ්ඩවල සිටින මුළු වැඩිහිටි ජනගහනය ගෘහමූලිකට ඇති නෑදෑකම අනුව**

| ගෘහමූලිකට ඇති නෑදෑකම | එකතුව | වයස් කාණ්ඩය (අවුරුදු) | | | | |
|---|---|---|---|---|---|---|
| | | **60-64** | **65-69** | **70-74** | **75-79** | **80ට වැඩි** |
| ගෘහකාණ්ඩවල සිටින මුළු වැඩිහිටි ජනගහනය | **2,496,038** | **910,836** | **628,006** | **408,404** | **279,871** | **268,921** |
| ගෘහමූලික | 1,386,872 | 518,485 | 361,164 | 234,150 | 150,673 | 122,400 |
| ස්වාමියා/භාර්යාව | 503,894 | 254,824 | 139,196 | 64,058 | 28,880 | 16,936 |
| දෙමාපියන් | 437,000 | 73,373 | 86,084 | 84,523 | 83,160 | 109,860 |
| ගෘහ සේවකයින් | 13,081 | 5,664 | 3,777 | 1,963 | 913 | 764 |
| වෙනත් | 155,191 | 58,490 | 37,785 | 23,710 | 16,245 | 18,961 |


ඉහත වගුව 6 අනුව වැඩිහිටියන්ගෙන් බහුතරය ගෘහමූලික ලෙස ක්‍රියාකරන බව පැහැදිලි වේ. එනම් වයස්ගත වූ නමුත් තම ගෘහ කාණ්ඩයේ වගකීම් තවදුරටත් ශේෂව ඇති බව මින් ගම්‍ය වේ. වයස්ගත බව නිසා ආර්ථික වශයෙන් ක්‍රියාකාරි වීමේ හැකියාව අඩුවීමත් හැකියාව ඇති අයට ද එවන් කටයුත්තක නියැලීමට ඇති අවස්ථා සුලබ නොවීමත් නිසා වැඩිහිටියන්ගෙන් විශාල පිරිසකගෙන් ආර්ථිකයට නිසි දායකත්වයක් නොලැබේ. සංගණන තොරතුරු අනුව වැඩිහිටියන්ගෙන් 1,876,226ක් එනම් සියයට 75ක් පමණ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවේ. තරුණ වැඩිහිටි කාණ්ඩවලදී වැඩිහිටියන් ගේ දොර වැඩ කටයුතු සඳහා සහභාගිවන බවත් ක්‍රමයෙන් වයස්ගතවීමේ දී ඉන් බැහැරවන බවත් පහත රූපසටහන 6න් පැහැදිලි වේ. තවද අවුරුදු 60-64 කාණ්ඩයේ ගේ දොර වැඩ කටයුතුවල නිරතවන කාන්තාවන්ගේ ප්‍රතිශතය සියයට 46ක් වන අතර පුරුෂයන්ගේ එම අගය සියයට 37ක් බව පෙනේ. තරුණ වැඩිහිටි

කාණ්ඩවලදී ගේ දොර වැඩ කටයුතුවල නිරතවන වැඩිහිටියන්ගෙන් යම් ප්‍රමාණයකින් ඵලදායි ආර්ථික දායකත්වයක් අපේක්ෂා කළ හැක.

රූප සටහන **6 :** ස්ත්‍රී පුරුෂ බව හා වයස් කාණ්ඩ අනුව ගේ දොර වැඩ කටයුතුවල නිරත වැඩිහිටියන්ගේ ප්‍රතිශතය - 2012




රූපසටහන **7 :** වැඩිහිටි ජනගහනය ආර්ථික කටයුතුවල නියැලීම 2012




සංගණන තොරතුරු අනුව වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින්ගෙන් සියයට 25.6ක් ආර්ථිකයට දායකත්වය ලබාදෙන අතර ඔවුන්ගෙන් අඩක්ම (55%) තමාගේම ආර්ථික කටයුතුවල නියැලෙන්නන් වීම සැළකිය යුතු කරුණකි. වෙළෙන්දන්, කෘෂි කාර්මික කටයුතුවල නියැලෙන්නන් වැනි තමන්ගේ


ව්‍යාපාර පවත්වා ගෙන යන අය මෙම කාණ්ඩයට අයත්වන අතර වයස්ගතවීමේ දී මෙම පුද්ගලයින්ට විශ්‍රාම වැටුපක් හෝ වෙනත් කිසියම් ආදායමක් නොමැත. වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් යෙදී සිටින ආර්ථික කටයුතු පිළිබඳ විස්තර වගුව 5 හි දැක්වේ. ආර්ථික කටයුතුවල නිරතවන වැඩිහිටියන්ගෙන් සියයට 2ක් රාජ්‍ය අංශයේ ද සියයට 1ක් අර්ධ රාජ්‍ය අංශයේ ද සියයට 32ක් පුද්ගලික අංශයේ ද වැටුප් ලබන සේවකයෝ වෙති.


**වගුව 7: වැඩිහිටි ජනගහනය වයස් කාණ්ඩ අනුව ආර්ථික කටයුතුවල නියැලීම**

| වයස් කාණ්ඩය | ආර්ථික කටයුතුවල යෙදෙන වැඩිහිටියන් | | සේවකයින් | | සේවා යෝජකයින් | | තමාගේම ආර්ථික කටයුතුවල නියැලෙන්නන් | | වැටුප් නොලබන ආර්ථික කටයුතුවල නියැලෙන්නන් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | **636,779** | **100.0** | **218,883** | **34.4** | **21,125** | **3.3** | **351,935** | **55.3** | **44,836** | **7.0** |
| **60-64** | 342,674 | 100.0 | 123,489 | 36.0 | 10,565 | 3.1 | 185,229 | 54.1 | 23,391 | 6.8 |
| **65-69** | 170,425 | 100.0 | 55,879 | 32.8 | 5,572 | 3.3 | 96,908 | 56.9 | 12,066 | 7.1 |
| **70-74** | 73,395 | 100.0 | 20,791 | 28.3 | 2,733 | 3.7 | 44,232 | 60.3 | 5,639 | 7.7 |
| **75-79** | 29,574 | 100.0 | 7,798 | 26.4 | 1,420 | 4.8 | 17,882 | 60.5 | 2,474 | 8.4 |
| **80ට** වැඩි | 20,711 | 100.0 | 10,926 | 52.8 | 835 | 4.0 | 7,684 | 37.1 | 1,266 | 6.1 |

## වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය

වැඩිහිටියන්ගේ ආයු කාලය දිගුවීමටත් වඩා වැදගත් වන්නේ දිගු කළක් සෞඛ්‍ය සම්පන්න ලෙස ජීවත්වීමට හැකියාව තිබේ ද යන්නය. වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව සොයා බැලීමේ දී ක්‍රමයෙන් වයස්ගතවීමේ දී ශාරීරික අපහසුතා ඇතිවීම වැඩිවන බව පෙනේ. අවුරුදු 60-64 වයස් කාණ්ඩයේ දී ද සෑම වැඩිහිටියන් පස් දෙනෙකුගෙන්ම එක් අයෙකුට කිනම් හෝ ශාරීරික අපහසුතාවක් ඇත. රූපසටහන 8ට අනුව වැඩිහිටි පුරුෂයින්ට සාපේක්ෂව වැඩිහිටි ස්ත්‍රීන් අතර ශාරීරික අපහසුතා තත්ත්වය වැඩි බව ද පෙනේ. වැඩිහිටියන්ගේ ශාරීරික අපහසුතා අතර පෙනීමේ හා ඇසීමේ අපහසුතා මෙන්ම ඇවිදීමේ අපහසුතා ද ප්‍රධාන වන බව රූපසටහන 9ට අනුව පැහැදිලි වේ.


රූපසටහන 8 : වයස් කාණ්ඩ අනුව ශාරීරික අපහසුතා ඇති වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශත - 2012
%
75
50
25
0
19.9
23.4
26.5
31.0
35.3
41.0
45.8
52.3
57.2
63.1
60 - 64
65 - 69
70 - 74
75-79
80+
පිරිමි
ගැහැණු


රූපසටහන 9 : වයස්ගතවීම නිසා සිදුවන අපහසුතා අනුව වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශත - 2012
%
30
20
10
0
21.8
19.4
11.3
8.3
4.8
3.0
පෙනීමේ අපහසුතා
ඇසීමේ අපහසුතා
ඇවිදීමේ අපහසුතා
මතක තබාගැනීමේ අපහසුතා
තමාගේ එදිනෙදා වැඩ කිරීමේ අපහසුතා
කතාකිරීමේ අපහසුතා

## වැඩිහිටියන්ගේ සමාජ සුභසාධන අවශ්‍යතා

වයස්ගත ජනගහනයේ සමාජ සුභසාධනය සඳහා රජය විසින් දැනටමත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට තිබේ. වැඩිහිටියන්ගේ ඉදිරි ජීවිත රැකවරණය උදෙසා පහත දැක්වෙන අංශ තවදුරටත් පුළුල් කිරීම සුදුසු වනු ඇත.

- සමස්ත වැඩිහිටි ප්‍රජාව සඳහා මෙන්ම වැඩිහිටි කාන්තාවන්ට ප්‍රමුඛතාව හිමිවන පරිදි වැඩිහිටියන් සුරැකිමේ මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන අංශ හා පෞද්ගලික අංශය දිරිගැන්වීම
- වැඩිහිටියන් අතර කිසියම් ආර්ථික කටයුත්තක නියැලීමේ හැකියාව ඇති හෝ කැමැත්ත ඇති පුද්ගලයින් සිටිය හැක. මෙවැනි පුද්ගලයින් සඳහා සුදුසු ආර්ථික කටයුතු හඳුන්වා දිය යුතු අතර කිසියම් නිෂ්පාදන කටයුත්තක නියැලෙන වැඩිහිටියන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා ද සුදුසු ක්‍රියා මාර්ග ආරම්භ කිරීම
- පෞද්ගලික අංශයේ හා අවිධිමත් අංශයේ නියුතු සියලු සේවකයින් සඳහා සුදුසු විශ්‍රාම ක්‍රමයක් ස්ථාපිත කිරීම
- මෙරට කාන්තාවන් බහුතරයක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන බැවින් වයස්ගතවීමේ දී වැඩිහිටි කාන්තාවන් ස්වාමියා හෝ දරුවන්ගේ යැපෙන්නන් බවට පත්වන බව දත්ත අනුව පැහැදිලි වේ. එබැවින් තරුණ වයස් කාණ්ඩවල දී කාන්තාවන් ආර්ථිකයට දායක වීම ඉහළ නැංවීම මෙන්ම මෙම තත්ත්වය පිළිබඳව සමාජය දැනුවත් කිරීම
- ආර්ථික වශයෙන් ක්‍රියාකාරි වන කාන්තාවන්ට ද මුදල් ඉතුරුම් ක්‍රම මෙන්ම රක්ෂණාවරන ලබා ගැනීම පිළිබඳ දැණුවත් කිරීම
- වැඩිහිටියන් අතරින් බහුතරයකගේ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සහන මිලට ඖෂධ සැපයීම අවශ්‍ය වේ. එමෙන්ම වෛද්‍ය පරීක්ෂණ හෝ වෙනත් සෞඛ්‍ය අවශ්‍යතාවල දී වැඩිහිටියන් සඳහා ප්‍රමුඛතාව ලබා දීම හෝ වැඩිහිටියන් සඳහා වන විශේෂ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඇති කිරීම
- වැඩිහිටියන්ගේ එදිනෙදා ජීවිතය නිදහස් පරිසරයක් තුළ සතුටින් ගත කිරීම සඳහා උද්‍යාන, ඇවිදීමේ මං තීරු, විවේකයන් ගත කිරීමට ආගමික සිද්ධස්ථාන ආශ්‍රිතව නිවාඩු නිකේතන ඇති කිරීමට රාජ්‍ය හා පෞද්ගලික අංශය දිරිගැන්වීම
- වයස්ගත හා ආබාධිත පුද්ගලයින් පොදු මගී ප්‍රවාහන මාධ්‍යයන් භාවිතයේ දී විවිධ ගැටළු ඇතිවේ. වයස්ගත පුද්ගලයින්ගේ ගමනාගමන කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයන් ඉදිරියේ දී සැලසුම් කිරීම

- වර්තමාන ජීව දත්ත අනුව පුරුෂයින්ගේ ආයු කාලය අඩුවීමේ ප්‍රවනතාව දැකිය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස වැඩිහිටි ජනගහනය අතර බහුතරයක් කාන්තාවන් වැන්දඹු වේ. එබැවින් වයස්ගත වීමට පෙර පුරුෂයින්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහා සුදුසු වැඩසටහන් ආරම්භ කිරීම
- විශේෂයෙන් වැටුප් ලබන ස්ථිර සේවකයින් සඳහා අදාල ආයතන විසින් අවුරුදු 50 හෝ ඊට ආසන්න වයස් කාණ්ඩවල දී සඳහා වෛද්‍ය පරික්ෂාවන් සිදු කිරීම අනිවාර්යය කිරීම හා රෝගී තත්ත්වයන් සහිත පුද්ගලයින්ට අදාල ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යොමු කිරීම
- අනෙකුත් ස්ථිර නොවන සේවකයින් සඳහා ද වයස්ගත වීමට ප්‍රථම එනම් අවුරුදු 50 හෝ ඊට ආසන්න වයස් කාණ්ඩවල දී අවශ්‍ය වෛද්‍ය පරික්ෂාවන්ට යොමු කිරීම සඳහා රජය මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

# වැඩිහිටි ජනගහනය පිළිබඳ සංඛ්‍යාලේඛන

## වගු ලැයිස්තුව


| | නම | පිටු අංකය |
|---|---|---|
| 1 | දිස්ත්‍රික්කය අනුව වැඩිහිටි ජනගහනය | 19 |
| 2 | දිස්ත්‍රික්කය හා වයස් කාණ්ඩය අනුව වැඩිහිටි ජනගහනය | 20 |
| 3 | ස්ත්‍රී පුරුෂ බව හා වයස අනුව වැඩිහිටි ජනගහනය | 21 |
| 4 | අංශය, වයස හා ස්ත්‍රී පුරුෂ බව අනුව වැඩිහිටි ජනගහනය | 22 |
| 5 | ගෘහමූලිකට ඇති නෑදෑකම,වයස් කාණ්ඩය හා ස්ත්‍රී පුරුෂ බව අනුව වැඩිහිටි ජනගහනය | 23 |
| 6 | විවාහක තත්ත්වය හා වයස අනුව වැඩිහිටි ජනගහනය | 24 |
| 7 | ස්ත්‍රී පුරුෂ භාවය හා අධ්‍යාපන මට්ටම අනුව වැඩිහිටි ජනගහනය | 25 |
| 8 | වයස් කාණ්ඩය, ස්ත්‍රී පුරුෂ භාවය හා සාක්ෂරතාවය අනුව වැඩිහිටි ජනගහනය | 26 |
| 9 | ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වැඩිහිටි ජනගහනය | 27 |
| 10 | ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන වැඩිහිටි ජනගහනය | 28 |
| 11 | රැකියාවේ නියුතු අංශ අනුව වැඩිහිටි ජනගහනය | 29 |
| 12 | රැකියාවේ තත්ත්වය අනුව වැඩිහිටි ජනගහනය | 30 |

ජන හා නිවාස සංගණනය - **2012**

වගුව **1:** දිස්ත්‍රික්කය අනුව වැඩිහිටි ජනගහනය

| දිස්ත්‍රික්කය | මුළු ජනගහනය | මුළු වැඩිහිටි ජනගහනය | % මුළු ජනගහනයෙන් |
|---|---|---|---|
| එකතුව | 20,359,439 | 2,520,573 | 12.4 |
| කොළඹ | 2,324,349 | 315,944 | 13.6 |
| ගම්පහ | 2,304,833 | 295,854 | 12.8 |
| කළුතර | 1,221,948 | 173,453 | 14.2 |
| මහනුවර | 1,375,382 | 186,033 | 13.5 |
| මාතලේ | 484,531 | 59,138 | 12.2 |
| නුවරඑළිය | 711,644 | 83,955 | 11.8 |
| ගාල්ල | 1,063,334 | 155,996 | 14.7 |
| මාතර | 814,048 | 120,094 | 14.8 |
| හම්බන්තොට | 599,903 | 70,914 | 11.8 |
| යාපනය | 583,882 | 84,434 | 14.5 |
| මන්නාරම | 99,570 | 8,252 | 8.3 |
| වවුනියාව | 172,115 | 14,985 | 8.7 |
| මුලතිව් | 92,238 | 7,860 | 8.5 |
| කිලිනොච්චි | 113,510 | 9,969 | 8.8 |
| මඩකලපුව | 526,567 | 40,139 | 7.6 |
| අම්පාර | 649,402 | 52,863 | 8.1 |
| ත්‍රිකුණාමලය | 379,541 | 29,063 | 7.7 |
| කුරුණෑගල | 1,618,465 | 210,551 | 13.0 |
| පුත්තලම | 762,396 | 79,602 | 10.4 |
| අනුරාධපුරය | 860,575 | 78,820 | 9.2 |
| පොළොන්නරු | 406,088 | 39,937 | 9.8 |
| බදුල්ල | 815,405 | 95,441 | 11.7 |
| මොණරාගල | 451,058 | 41,654 | 9.2 |
| රත්නපුරය | 1,088,007 | 140,553 | 12.9 |
| කෑගල්ල | 840,648 | 125,069 | 14.9 |

ජන හා නිවාස සංගණනය - 2012

වගුව 2: දිස්ත්‍රික්කය හා වයස් කාණ්ඩ අනුව වැඩිහිටි ජනගහනය

| දිස්ත්‍රික්කය | මුළු වැඩිහිටි ජනගහනය | වයස් කාණ්ඩ | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 60 - 64 | % | 65 - 69 | % | 70 - 74 | % | 75 - 79 | % | 80 සහ ඊට වැඩි | % |
| **එකතුව** | **2,520,573** | **917,910** | **36.4** | **633,289** | **25.1** | **412,414** | **16.4** | **283,186** | **11.2** | **273,774** | **10.9** |
| කොළඹ | 315,944 | 110,481 | **35.0** | 81,671 | **25.8** | 51,852 | **16.4** | 35,359 | **11.2** | 36,581 | **11.6** |
| ගම්පහ | 295,854 | 106,351 | **35.9** | 75,831 | **25.6** | 47,700 | **16.1** | 32,632 | **11.0** | 33,340 | **11.3** |
| කළුතර | 173,453 | 57,997 | **33.4** | 44,037 | **25.4** | 29,670 | **17.1** | 20,852 | **12.0** | 20,897 | **12.0** |
| මහනුවර | 186,033 | 66,371 | **35.7** | 47,001 | **25.3** | 31,692 | **17.0** | 20,638 | **11.1** | 20,331 | **10.9** |
| මාතලේ | 59,138 | 22,289 | **37.7** | 14,461 | **24.5** | 9,964 | **16.8** | 6,496 | **11.0** | 5,928 | **10.0** |
| නුවරඑළිය | 83,955 | 32,594 | **38.8** | 23,311 | **27.8** | 13,612 | **16.2** | 8,223 | **9.8** | 6,215 | **7.4** |
| ගාල්ල | 155,996 | 49,046 | **31.4** | 38,979 | **25.0** | 26,729 | **17.1** | 20,274 | **13.0** | 20,968 | **13.4** |
| මාතර | 120,094 | 38,603 | **32.1** | 28,886 | **24.1** | 18,925 | **15.8** | 15,769 | **13.1** | 17,911 | **14.9** |
| හම්බන්තොට | 70,914 | 26,524 | **37.4** | 15,440 | **21.8** | 10,289 | **14.5** | 8,845 | **12.5** | 9,816 | **13.8** |
| යාපනය | 84,434 | 30,976 | **36.7** | 21,573 | **25.6** | 14,317 | **17.0** | 9,508 | **11.3** | 8,060 | **9.5** |
| මන්නාරම | 8,252 | 3,675 | **44.5** | 1,865 | **22.6** | 1,284 | **15.6** | 801 | **9.7** | 627 | **7.6** |
| වවුනියාව | 14,985 | 6,195 | **41.3** | 3,668 | **24.5** | 2,285 | **15.2** | 1,511 | **10.1** | 1,326 | **8.8** |
| මුලතිව් | 7,860 | 3,466 | **44.1** | 2,048 | **26.1** | 1,163 | **14.8** | 653 | **8.3** | 530 | **6.7** |
| කිලිනොච්චි | 9,969 | 4,281 | **42.9** | 2,574 | **25.8** | 1,589 | **15.9** | 938 | **9.4** | 587 | **5.9** |
| මඩකලපුව | 40,139 | 16,201 | **40.4** | 10,363 | **25.8** | 6,572 | **16.4** | 4,029 | **10.0** | 2,974 | **7.4** |
| අම්පාර | 52,863 | 21,107 | **39.9** | 14,098 | **26.7** | 8,529 | **16.1** | 5,151 | **9.7** | 3,978 | **7.5** |
| ත්‍රිකුණාමලය | 29,063 | 11,795 | **40.6** | 7,432 | **25.6** | 4,684 | **16.1** | 2,863 | **9.9** | 2,289 | **7.9** |
| කුරුණෑගල | 210,551 | 81,510 | **38.7** | 49,024 | **23.3** | 34,350 | **16.3** | 23,174 | **11.0** | 22,493 | **10.7** |
